# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.01.17 පැය 1540 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 79 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2025.01.16 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාතර්ාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 06 | 06 | 283 | 140 | ප්ලාස්ටික් බූලි 07<br>ජංගම දුරකථන 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. කේරළ ගංජා හා අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2025.01.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රාගම පොලිස් වසමේ හැඳල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා කිලෝ 03 ග්‍රෑම් 90 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 ක්, ඩිජිටල් තරාදි 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන රාගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන හැඳල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රාගම පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

03. **වෙඩි තැබීමේ අපරාධයකට සම්බන්ධ යතුරු පැදියක් සොයා ගැනීම - විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් අංශය**

2025.01.16 වන දින සවස් කාලයේ විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරින් කණ්ඩායමක් විසින් පිළියන්දල පොලිස් වසමේ වැටලීමක් සිදු කර කළුබෝවිල ප්‍රදේශයේදී සිදු කළ වෙඩි තැබීමට පැමිණි වෙඩික්කරුවන් පදවාගෙන ආ යතුරු පැදිය මාම්පේ ප්‍රදේශයේදී මාගර්යේ අයිනක දමා ගොස් තිබියදි සොයාගෙන කොහුවල පොලිස් ස්ථානයට භාර දී අත.

සිද්ධියට සම්බන්ධ සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා කොහුවල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

04. **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2025.01.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වත්තල පොලිස් වසමේ වත්තල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 ක් සමඟ ත්‍රිරෝද රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන වත්තල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 33 හා 25 වයස් වල පසුවන** වත්තල **ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වත්තල පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

05. **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය රත්ගම කඳවුර.**

2025.01.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය රත්ගම කඳවුර නිලධාරීන් කණ්ඩායමක් විසින් මීටියාගොඩ පොලිස් වසමේ මීටියාගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 77 ක්, ගංජා ග්‍රෑම් 100 ක් හා ඉලෙක්ට්‍රොනික තරාදියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මීටියාගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන මීටියාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

වත්තල පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

06. **අනවසරයෙන් කපන ලද විවිධ ප්‍රමාණයේ දැව සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුර**

2025.01.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා දඹුල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දඹුල්ල පොලිස් වසමේ කපුවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව විවිධ ප්‍රමාණයේ කපන ලද තේක්ක දැව කඳන් 19 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන නාවුල අඩවි වන නිලධාරී කාර්යාලය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 19 ක් වන දඹුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

## 07. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුර

2025.01.16 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අහුංගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොස්ගොඩ පොලිස් වසමේ ඌරගස්මංහන්දිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මත්කරල් 1540 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන** ඌරගස්මංහන්දිය **ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඌරගස්මංහන්දිය පොලිසිය විසින් වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**